www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ් පාලන තන්ත්‍රය හා සර්කාවි මරා දැමීම

## The Bush administration and the killing of Zarqawi

**බැරී ග්‍රේ විසිනි**
**2006 ජුනි 9**

අබු මුසාබ් අල් සර්කාවි මරාදැමීම ඇමරිකානු යුද හමුදාවටත් මෑත දී බැග්ඩෑඩ්හි පිහිටුවන ලද ආන්ඩුවටත් විශාල ජයග්‍රහනයක් ලෙස හුවා දැක්වීමට බුෂ් පාලන තන්ත්‍රය හා එක්සත් ජනපද ජනමාධ්‍ය ඉමහත් ප්‍රයත්නයක යෙදී සිටී.

මේ ඉස්ලාම්වාදී ත්‍රස්තවාදියාගේ මරනය එක්සත් ජනපදයෙහි හා බැග්ඩෑඩ්හි එහි රූකඩ ආන්ඩුවෙහි සාර්ථක ප්‍රචාරාත්මක මෙහෙයුමක් සේ හුවාදැක්වීම, නරුමත්වය හා අපේක්ෂා භංගත්වය එකට කැටිවූ අශික්ෂිත දසුනකි.

එක්සත් ජනපද වේලාවෙන් බ්‍රහස්පතින්දා උදයෙහි ඉරාකයෙහි ඉහලම එක්සත් ජනපද නිලධාරියා වන ජනරාල් ජෝර්ජ් කේසි හා ඇමරිකානු තානාපති සල්මි කලිල්සාඩ් දෙපසින් හිඳුවාගෙන බැග්ඩෑඩ්හි රැකවල් බෙහෙවින් ශක්තිමත් කරන ලද හරිත කලාපය තුල අගමැති නූරි අල්-මලිකි සාකච්ඡාවක් පැවැත්වී ය. එහි අරමුන වූයේ බැග්ඩෑඩයට ඊසාන දිගින් පිහිටි නගරයක් වන බාකුබාවලින් පිටත පිහිටි "ආරක්ෂිත රහස්‍ය නිවසක" එල්ල කරන ලද එක්සත් ජනපද ගුවන් ප්‍රහාරයකින් ජෝර්දානයෙහි උපත ලත් මේ ත්‍රස්තවාදියා තව පුද්ගලයන් පස් දෙනෙකු සමග මරා දමන ලද බව නිවේදනය කිරීමට ය.

සර්කාවි "අවසන් කරන ලද" බවට මලිකි උදම් ඇනීය. එකක් රාත්තල් 500ක් බැගින් බරැති බෝම්බ දෙකක් හෙලීමෙන් බදාදා සවස මරනයට පත්වූවන් අතර මවක් හා දරුවෙක් සිටි බව පසුව එක්සත් ජනපද යුද හමුදා ප්‍රකාශකයෙක් පිලිගත්තේ ය.

ඇමරිකානු ඝාතන පිලිබඳව එලිදරව් කිරීම්වලින් මහජන අවධානය අපසරනය කිරීම සඳහා මෙම ප්‍රවෘත්තිය යොදා ගැනීමට උත්සාහ කිරීමේ දී බුෂ් කාලය අපතේ නොයැවී ය. බෙහෙවින්ම යුද්ධයට එරෙහි පලල් සහ වැඩෙන මහජන විරුද්ධත්වයේ ප්‍රහාර මාලාවක් ලෙස ද, ඔහුගේ පාලන තන්ත්‍රයේ අනුමත රේට්ටුව තියුනු ලෙස පහල වැටීම වලකා ගැනීමට එමගින් ඔහු බලාපොරොත්තු විය.

බ්‍රහස්පතින්දා පෙරවරුවෙහි ධවල මන්දිරයේ සිට කරන ලද ප්‍රකාශවලින් බුෂ් කියා සිටියේ "ඉරාකයේ ත්‍රස්තවාදී ව්‍යාපාරයේ ක්‍රියාන්විත අන දෙන නිලධාරියාට යුක්තිය ඉටු කරන ලද" බවය. ලොව ඉස්තරම් යුදහමුදාවේ "ධෛර්යය හා වෘත්තීයතාව" පිලිබඳ ඔහු ප්‍රශංසා කලේ ය.

ඉරාකයෙහි මරන හා විනාශය හීන වෙතැයි හෝ ඇමරිකානුන් ඉක්මනින් ආපසු සිය රට බලා එනු ඇතැයි යන අපේක්ෂාවනට එරෙහිව ඔහු අනතුරු හැඟවී ය. "සර්කාවි මරනයට පත්ව ඇති" නමුදු ඉරාකයෙහි දුෂ්කර හා අවශ්‍ය මෙහෙවර දිගටම පවත්වා ගෙනයනු ඇතැයි ඔහු පැවසී ය. ඔහු ජීවතුන් අතර නැති තත්වයක දී වුව ත්‍රස්තවාදීන් හා කැරලිකරුවන් තව දුරටත් ක්‍රියාත්මක වීම අප අපේක්ෂා කල යුතු ය." "ඉදිරි දුෂ්කර කාල පරිච්ඡේදයක්" ගැන අනතුරු ඇඟවූ ඔහු "තව දුරටත් ඉවසන ලෙස ඇමරිකානු ජනතාවගෙන්" ඉල්ලා සිටියේ ය.

ඩිමොක්‍රැටික් පාක්ෂිකයෝ සර්කාවිගේ මරනය අනුමත කරන්නන්ගේ ගොඩට ඉක්මනින් එකතු වූහ. 2008 වසරෙහි ජනාධිපතිවරනයේ ඩිමොක්‍රැටික් පක්ෂය ආරක්ෂකයා ලෙස නාම යෝජනා ඉදිරිපත් කිරීමේ සිය අරමුන නිවේදනය කර ඇති සෙනෙට් සභික ජෝසෆ් බිඩන් සීඑන්එන් පුවත් සේවාවට දන්වා සිටියේ සර්කාවි මරා දැමීම "යහපත් ප්‍රවෘත්තියක්" බවය. එක්සත් ජනපද යුද හමුදාව වර්නනා කිරීමට ද ඉදිරිපත් විය.

ඔවුන්ගේ ම ප්‍රකාශවලට අනුව ඔහුගේ සාමාජිකයන්ගෙන් (අනුමාන කල හැකි පරිදි වධදීම් මගින්) ලබා ගත් තොරතුරු ඔස්සේ එක්සත් ජනපද මිලිටරිය සහ බුද්ධි අංශය සැහෙන කාලයක් සර්කාවි පසුපස හඹා ගොස් තිබේ. මේ අවස්ථාවේ දී ක්‍රියාත්මක වීමට ඔවුන් තීරනය කලේ මන් ද? මේ කාලය ඒ සඳහා ම යොදා ගැනීම බුෂ් පාලන තන්ත්‍රය තුල දේශපාලන අර්බුදය පිලිබඳව වර්ධනය වන සංඥා ඉරාකය අල්ලාගෙන සිටින එක්සත් ජනපද භට කන්ඩායම් අධෛර්යමත් වීම යන කරුනු හා එකට බැඳී තිබීම නිසැක ය.

ඉරාක ජීවිත සම්බන්ධයෙන් අසංවේදී නොසැලකිල්ල ගැන ඉරාක අගමැති මලිකි එක්සත් ජනපද යුද හමුදා ප්‍රසිද්ධියේ හෙලා දැක්කේ මීට දින කිහිපයකට පෙරය. හදිතාහි එක්සත් ජනපද නාවිකයින් විසින් ඉරාක සිවිල් වැසියන් 24 දෙනෙකු මරනයට පමුනුවීම සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වූ මලිකි කියා

සිටියේ එවැනි ම්ලේච්ඡ ක්‍රියා "දෛනික සංසිද්ධියක්" බවය. ඇමරිකානු භටයන් ඉරාක ජනයා කෙරෙ "කිසිදු ගෞරවයක් නොදක්වන බවට" ඔහු චෝදනා කලේ ය.... සිය වාහනවලට ඔවුන් යට කරති. හුදෙක් අවිශ්වාසයක් හෝ අනුමානයක් මත ඔවින් මරා දමති."

කිසියම් අවස්ථාවකදී පක්ෂපාතිත්වය කාටදැයි තීරනය කිරීමට අපහසු අවිනිශ්චිත පුද්ගලයන්ගෙන් සර්කාවි එක් අයෙකු වූ බව එක්සත් ජනපද බුද්ධි අංශය හොඳින් දැන සිටියේ ය. මූලධර්මවාදියෙකු වූ ඔහු ඉරාකය තුල අන්ත ප්‍රතිගාමී අංශ නියෝජනය කල අයෙකි. වොෂින්ටනය විසින් චෝදනා කරන ලද පරිදි අනේකවිධ ම්ලේච්ඡ ක්‍රියාවලට ඔහු යම් ප්‍රමානයකට සම්බන්ධ වී ද එහි දී ඔහුගේ භූමිකාව වූයේ ඉරාක ප්‍රතිරෝධයට යටින් වල කැපීම හා සුන්නි ෂියායිට්වරුන් අතර කට්ටිවාදී සිවිල් යුද්ධය අවුලුවීම ය.

පසු කාලීනව එක්සත් ජනපදයට එරෙහි වූ බින් ලාඩන් ඇතුලු සෙසු බොහෝ අය මෙන් ම සෝවියට් මිලිටරි වාඩි ලා ගැනීමට විරුද්ධව එක්සත් ජනපද පිටුබලය ලත් ගරිල්ලා යුද්ධයට සම්බන්ධ වීම සඳහා 1989 මුල දී ඇෆ්ගනිස්ථානයට යාම මගින් ජිහාඩ්වාදියෙකු ලෙස සර්කාවි ඔහුගේ ජීවන වෘත්තිය ආරම්භ කලේ ය.

2003 ඉරාකය ආක්‍රමනය කිරීමට පෙරාතුව පවා එහි නීති විරෝධී මැදිහත්වීම යුක්ති සහගත කිරීම සඳහා රට තුල සර්කාවිගේ භූමිකාව බුෂ් පාලන තන්ත්‍රය විසින් බෙහෙවින් අතිශයෝක්තියට නැංවී ය. 2003 පෙබරවාරි මස එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය ඉදිරියේ කරන ලද දූනට අපකීර්තිමත් ලෙස සැලකෙන දේශනයෙන්, සර්කාවි, සදාම් හුසේන්ගේ බාත්වාදී තන්ත්‍රය හා අල්කයිඩා සංවිධානය අතර සන්ධානයෙහි පුද්ගලාරෝපනය ලෙස එවකට රාජ්‍ය ලේකම් කොලින් පවල් හුවා දැක්වී ය. පසුගිය බ්‍රහස්පතින්දා සිය වෙබ් අඩවියෙහි පලකරන ලද ලිපියකින් විදේශ සම්බන්ධතා මන්ඩලය මේ ප්‍රකාශය කෙලින්ම "බොරුවක්" බවට සඳහන් නොකොට පසුව ඔප්පු නොකරන ලද්දක්"ලෙස කියා පෑය.

ආක්‍රමනයත් සමග ඉරාක ප්‍රතිරෝධය වර්ධනය වත් ම බුෂ් පාලන තන්ත්‍රය ද ඒ පිටුපස ජනමාධ්‍ය හා ඩිමොක්‍රැටික් පක්ෂය ඇදී යමින් ද එක්සත් ජනපද ආක්‍රමනිකයින්ට විරෝධය දක්වන සියල්ලන්ම සර්කාවි හා ප්‍රතිබද්ධසේ දැක්වී ය. එහි අරමුන වූයේ විදේශීය ආක්‍රමනිකයින් ගෙන් නිදහස් වීමට සටන් කරන ඉරාක ජාතිකයින් අවමානයට ලක් කිරීමයි.

ඒ සමග ම මුඛ්‍ය අවස්ථාවල සර්කාවිට ආරෝපනය කරන ලද ක්‍රියා එක්සත් ජනපදයෙහි අවශ්‍යතාවලට තල්ලුව සැපයී ය. 2004 පෙබරවාරියේ, ප්‍රධාන වසයෙන් සුන්නි ප්‍රදේශවල පැවති සන්නද්ධ ප්‍රතිරෝධයට ෂියායිට් ජනතාව සම්බන්ධ වීමට ආසන්නව තිබිය දී සර්කාවි විසින් නිර්මානය කරන ලදැයි කියවුනු ප්‍රසිද්ධ ලිපියකින් ෂියයිට්වරුන් සමග සිවිල් යුද්ධයක් අවුලුවන ලෙස සුන්නිවරුන්ගෙන් ඉල්ලා සිටියේ ය. සති ගනනාවකට පසුව කර්බාලා හා බැග්ඩෑඩ්හි ෂියායිට් දේවස්ථානවලට එල්ල කරන ලද මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර " සර්කාවි ජාලයෙහි" වැඩක් ලෙස එක්සත් ජනපදය විසින් හඳුන්වන ලදි.

2004 මැයි මස අබු ග්‍රයිබ් සිරගෙයි සිදුවුනු වධ හිංසාවල බිහිසුනු ඡායාරූප හමුවීමෙන් කෙටි කලකට පසුව, ඇමරිකානු ව්‍යාපාරික නිකොලස් බර්ජ් බලෙන් පැහැරගෙන ගියේ ය. එක්සත් ජනපදයට අනුව සර්කාවි විසින් පෞද්ගලිකව ම ඔහුගේ හිස ගසා දමන ලදි. බර්ජ් නිදහස් කිරීමට මත්තෙන් එක්සත් ජනපද යුද හමුදාව විසින් දින 13ක් ඔහුව රඳවාගෙන ප්‍රශ්න කරන ලදි. ඊට කෙටි කලකට පසුව ඔහු අනතුරුව ඔහුව ඝාතනය කල පුද්ගලයින් විසින් පැහැරගෙන යන ලදි. මේ සාපරාධී ක්‍රියාවෙහි අඳුරු වාතාවරනය හා ඇමරිකානු බලධාරින්ගේ භූමිකාව කිසි විටෙක පැහැදිලි නැත.

එවැනි ම්ලේච්ඡ ක්‍රියා ඉරාක ප්‍රතිරෝධ වැලැක්වීමට හෝ එක්සත් ජනපදය තුල යුද විරෝධී මනෝ භාවයන්ගේ වර්ධනය නැවැත් වීමට අසමත් වීම ආධිපත්‍යයෙහි හෝ ස්ථාවරත්වයෙහි යම් සේයාවක් හෝ ඇති ආන්ඩුවක් බැග්ඩෑඩ්හි ස්ථාපිත කිරීමට ඉතා දැඩි ලෙස ඕනෑ කරන තත්වයකට වොෂින්ටනය පත් වූ විට සර්කාවිගේ ක්‍රියා ඇමරිකානු අවශ්‍යතාවන්ට බාධාවක් වන බව දිස් වුනි.

බුෂ් පාලන තන්ත්‍රය විසින් සර්කාවි කෙරේ ආරෝපනය කරන ලද බලපෑම සර්කාවි කිසි දිනෙක භාවිතයේ නොයෙදූ බව එම තන්ත්‍රය හොඳින්ම දනී. ඉරාකයෙහි එක්සත් ජනපදය මුහුන දෙන දරුනු තත්වය මත සර්කාවි ඉවත්කිරීම් බලපෑම පිලිබඳව බුෂ් හා අනෙකුත් පාලන තන්ත්‍ර ප්‍රකාශකයින් විසින් කරන ලද අනතුරු හඟවන අන්දමේ ප්‍රකාශ පිටුපස ඇති එක හේතුවක් මෙයයි.

*ස්ට්‍රැට්ෆෝර්* නමැති ඇමරිකානු වෙබ් අඩවියට එක්සත් ජනපද යුද හමුදාව හා බුද්ධි සංස්ථාපනයෙහි කොටස් සමග සමීප සබඳකම් ඇති අතර එම වෙබ් අඩවිය ඉරාකය එක්සත් ජනපදය විසින් අල්ලා ගැනීමට සහය දක්වන්නකි. එහි බ්‍රහස්පතින්දා පල කරන ලද ලිපියකින් මෙසේ කියැවේ: "යම් අවස්ථාවක ඉරාකයෙහි ක්‍රියාත්මක වන විදේශීය ජිහාඩ්වරුන්ගේ සංඛ්‍යාව 800ක් හා 1000ක් අතර වේ. යයි බොහෝ තක්සේරු ගනනය කර ඇත." මෙය මුලු කැරැල්ලෙහි නිරත සංඛ්‍යාව සේ එස්තමේන්තු කර ඇති 15,000ක් හා 20,000ක් අතර ප්‍රමානයෙන් සුලු කොටසකි."

සර්කාවිගේ සංවිධානය ප්‍රතිරෝධය තුල ජාතිකවාදී කන්ඩායම් සමග වැඩි වැඩියෙන් ගැටුම් ඇති කර ගන්නා තත්වයක් උදාවී ඇති බව එම ලිපියෙහි සටහන් වුනි.

දවස පුරා නොනවත්වා පැවති මාධ්‍ය ප්‍රමෝදයක වාතාවරනයක් තුල අසංගත ප්‍රකාශ කිහිපයකින් එකක් වූයේ වාර්තාකරුවෙකු හා කර්තෘවරයෙකු වූ නිර් රොසන්ගේ ප්‍රකාශය යි.

සීඑන්එන් රූපාහිනී සේවය සමග කරන ලද සම්මුඛ සාකච්ඡාවක දී ඔහු මෙසේ කරුනු දැක්වී යෑ "සර්කාවි පිලිබඳ ජනප්‍රවාදය ඇමරිකානු නිර්මානයකි." ඔහු තව දුරටත් පැහැදිලි කලේ, ඉරාක කැරැල්ල අවමනට ලක් කරනු වස් එක්සත් ජනපදය සර්කාවිගේ භූමිකාව අතිශයෝක්තියෙන් ඉදිරි පත් කල බවය. සර්කාවි නොසිටීමත් ඉරාකය තුල එක්සත් ජනපදයෙහි තත්වය දියුනු කිරීමට හේතු නොවන බවට ඔහු නිගමනය කලේ ය.

තවත් විවේචනාත්මක ප්‍රකාශයක් විය. කෙලින් කරුනු දක්වීම හා ප්‍රතිපත්තිමය හරය අතින් එය අපූරු ප්‍රකාශයක් විය. සර්කාවි අතින් මැරුම්කෑවේ යයි කියනු ලබන අයෙකි මයිකල් බර්ජ්ගේ පුත් නිකලස් මෙම ත්‍රස්තවාදියාගේ (සර්කාවිගේ) මරනය ගැන ඔහුගේ අදහස් විමසූ විට මෙසේ ප්‍රකාශ කිරීමෙන් ඔහු සීඑන්එන් රූපවාහිනී සේවයෙහි නිවේදක නිරුත්තර කලේ ය. " බුෂ් ඉරාකය ආක්‍රමනය කිරීමට පෙරාතුව එහි අල්කයිඩා සංවිධානයෙහි සාමාජිකයින් නොවී ය"යි ඔහු කීය. " සදාම් හුසේන් යහපත් මිනිසෙකු යි මම නොකියමි. ඔහු යටතේ වසරකට ඉරාකවරුන් 30,000ක් මරුමුවට පත් විය. දැන් 60,000ක් මරනයට පත්වේ.... සදාම් හුසේන් වෙනුවට බුෂ් රජ වීමෙන් ඉරාකයට වඩාත් යහපත් තත්වයක් උදාවී ඇතැයි කියන්නේ කෙසේ ද?"

© www.wsws.org